0132
057945
ML/PR
2020/02/18

# පහතරට නර්තන කලාවේ අන්තර්ගත

## දක්ෂිණ භාරතීය ආභාසය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට

දර්ශනසූරි උපාධි අවශ්‍යතා සඳහා ඉදිරිපත් කෙරෙන

ස්වතන්ත්‍ර පර්යේෂණ නිබන්ධය

Main_Library_UVPA
057945

නම : එච්.ජී.ඩී.පී. සමන්ති

ශිෂ්‍ය අංකය : GS/Ph.D/DD/08/013

පීඨය : නර්තන හා නාට්‍ය කලා පීඨය

ඉදිරිපත් කරන වර්ෂය : 2019 ඔක්තෝබර්

057945

# සාරාංශය


ශ්‍රී ලංකාවේ අනාදිමත් කාලයක සිට ජීවත් වන ලාංකික ජනතාවත් භාරතයේ දක්ෂිණ ප්‍රාන්තවල ජීවත් වන ජනතාවත් අතර ඇති සහසම්බන්ධතාවන් විමසීම උදෙසා එහි මූලික පදනම බවට පත්ව තිබෙන භූගෝලීය පසුබිම මෙහ දී විග්‍රහයට ලක් කළෙමු.

මෙම පර්යේෂණයේ දී මූලික අවධානය යොමු වූයේ භාරතීය නර්තනයෙන් පහතරට නර්තනය කෙරෙහි යම් ආභාසයක් ලැබී තිබේදැයි විමර්ශනය කිරීම කෙරෙහි ය.

පර්යේෂණ ගැටලුවෙහි ප්‍රධාන අභියෝග ජය ගැනීමේ පසුබිම සැකසීමේ අරමුණ පෙරදැරි කර ගනිමින් ගොනු වන ඉතා පුළුල්ව ශ්‍රී ලංකාවේ පහතරට ප්‍රදේශයේ ව්‍යාප්තව පවතින නර්තන කලාවක් හඳුනා ගැනීමටත් එය ඉතා නිරවද්‍යව හා නිරවුල්ව කරුණු ඉදිරිපත් කිරීමටත් සිදු විණි.

එහිදී භාරතීය නර්තනය පිළිබඳව සහ පහතරට නර්තනය පිළිබඳ හැඳින්වීමක් ද කරන්නට සිදු විය. එම නර්තනයන් පිළිබඳව සංසන්දනාත්මකව බැලීමේ දී බොහෝ දුරට සමානතා පවතින බවට ප්‍රත්‍යක්ෂ විය. එම සමානතා භාරතීය ආභාසය නිසා සිදු වී යැයි සැක කළ හැක්කේ දෙරට අතර නිරන්තර සංස්කෘතික සබඳතා පැවති හෙයිනි. මෙහිදී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයන් මෙන්ම ක්ෂේත්‍ර අධ්‍යයනය ද ඔස්සේ පර්යේෂණය සිදු කරන්නට විණි.

දෙරටේ සබඳතා සනිටුහන් කෙරෙන ඓතිහාසික සාධක මගින් ගොඩනැගුණු සංස්කෘතික, සමාජයීය, දේශපාලනික හා ආර්ථික බැඳීම සොයා බැලීමත් එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ පහතරට නර්තන කලාවත්, දක්ෂිණ භාරතයේ ප්‍රචලිත ශාස්ත්‍රීය නර්තන සම්ප්‍රදායයන් අතර සබඳතා ගොඩනැගී ඇති බවටත් මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වෙයි.

දෙරටේම සංස්කෘතික සමානතා පැවතීමට හේතු වූ භූගෝලීය පසුබිම ඇ ඔස්සේ දකුණු ඉන්දියානු ශාස්ත්‍රීය නර්තන හා ශ්‍රී ලංකාවේ පහතරට නර්තනය යන දෙපාර්ශ්වය හඳුනා ගැනීමටත් ඇති අවකාශ සාක්ෂාත් කර ගැනීමත් මෙම අධ්‍යයනයෙන් ඉටු කෙරුණි.

දක්ෂිණ භාරතීය සංක්‍රමණ බොහෝ විට පහතරට නර්තන කලාවේ උන්නතියට හේතු වූ බව පැහැදිලි වේ. එහිදී ඒකීය සිද්ධාන්ත ක්‍රමයක් අනුගමනය කෙරෙන දක්ෂිණ ප්‍රාන්ත හතරේම භාරතීය නර්තනයන් වඩා ඵලදායී කරුණු පමණක් උකහා ගනිමින් පහතරට නර්තන කලාව පෝෂණය කර ඇති බවට කරුණු ප්‍රත්‍යක්ෂ විය.

භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රය ග්‍රන්ථය හා එහි ප්‍රකාශිත අදහස් ගැන ද මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු විය. ඊට හේතුව නාට්‍යශාස්ත්‍රයේ ප්‍රකාශිත විවිධ කාරණා මෙම නර්තන දෙවර්ගයෙහිම දැකිය හැකි වීම ය.

භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රය ලංකාවේ භාවිත වූ බවට නොයෙක් සාධක ඇත. විශේෂයෙන් කෝට්ටේ අවධියේ දී නාට්‍යශාස්ත්‍රයට අනුව නර්තනය සිදු කළ බව ගුත්තිල කාව්‍යය,[1] තිසර සන්දේශය,[2] හංස සන්දේශය[3] හා සැවුල් සන්දේශය[4] සාක්ෂ්‍ය දරයි.

එකී නිදසුන්වලින් තහවුරු වන්නේ භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රය කෝට්ටේ අවධියේ දී නර්තනයේ දී විශේෂයෙන් භාවිත වූ බව ය. ඒ අනුව නාට්‍යශාස්ත්‍රය කෘතියේ ආභාසය අපට හඳුනාගත හැකි ය. නාට්‍යශාස්ත්‍ර කෘතිය භාරතීය නර්තනයට සේම අපගේ නර්තනයට ද ආභාසය සැලසූ බැව් මේ අනුව තහවුරු වේ.

භාරතීය නර්තනයේ භාවිත කතා වස්තු, රංග ශෛලිය, නර්තන විධි, ගායනය විධි, රංග වස්ත්‍රාභරණ, රංගභූමිය, රංග පෙළපාළි ආදී වශයෙන් විවිධ මාතෘකා ඔස්සේ මෙම සංසන්දනාත්මක අධ්‍යයනය සිදු කළෙමු. එමගින් දක්ෂිණ භාරතීය නර්තන විධික්‍රම විවිධ ආකාරයෙන් පහතරට නර්තනය කෙරෙහි බලපා ඇති අයුරු දැක ගත හැකි විය.

---

| | | |
|---|---|---|
| 1 | බරත සැක හළු | වෝ |
| | රඟින් දන මන වෙළු | වෝ |
| | වෙසින් සුලකුළු | වෝ |
| | පසෙක සිටියෝය නන් නළු | වෝ |
| | | **ගුත්තිල කාව්‍ය 252 කවිය** |
| 2 | නියෙනග බරතැඳුරන් කී ලොව | වා |
| | බැස රඟ තමනතු පදයෙහි පිහි | වා |
| | | **තිසර සන්දේශය 164 කවිය** |
| 3 | බරත සතෙහි පෙර ඉසිරවර කී ලෙස | ට |
| | දෙනෙත යුගක දෙපසෙහි පමණ සරි කො | ට |
| | | **සැවුල් සන්දේශය 179 කවිය** |
| 4 | බරත සතර රඟටම කළ හැමපා ල | ම |
| | වයත නොහැර මද්දල සුද්ද තාල | ම |
| | | **හංස සන්දේශය 109 කවිය** |